# මානවවිද්‍යාවේ අද්‍යතනතාව සහ විද්‍යාත්මක වලංගුභාවය

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් අමරසිංහ, කථිකාචාර්ය සමිත උදයංග**

සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

**senithsrisami@gmail.com**

## හැඳින්වීම

මානව සමාජය බහුවිධ සත්‍යතාවන් ඒකාබද්ධ වූ ස්ථානයකි. භෞතික පැවැත්ම සම්බන්ධයෙන් සත්‍ය වන මූලධර්මයන් අතැම් අවස්ථාවන්හි දී සමාජ පැවැත්ම හා සම්බන්ධ මූලධර්මයන් සමග සමපාත නොවන අවස්ථාවන් දැකිය හැකි ය. එ බැවින් 'සත්‍ය යනු කුමක් ද?' යන්න ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කර ගැනීම මානව පැවැත්ම කෙරෙහි විශේෂයෙන් බලපෑම් කරයි. පුද්ගලයා තමා ජීවත් වන භෞතික සහ සමාජ පරිසරයෙහි ස්වභාවය ක්‍රමානුකූලව අවබෝධ කර ගැනීම, පැවැත්ම ස්ථාවර කිරීම සඳහා කිසියම් මග පෙන්වීමක් සිදු කරයි. මේ නිසා පැවැත්ම සම්බන්ධයෙන් මූලික මූලධර්මයන් පිළිබඳ ප්‍රත්‍යක්ෂ ඥානයක් ලබා ගැනීම සමාජ සහ භෞතික පැවැත්ම සම්බන්ධයෙන් ද විශේෂයෙන් වැදගත් වේ. බොහෝමයක් ස්වාභාවික විද්‍යාවන් ගොඩනැගී තිබෙන්නේ පුද්ගලයා සහ සම්බන්ධ වන භෞතික පැවැත්ම ආශ්‍රිත මූලධර්මයන්හි සත්‍යතාව ගවේෂණය කිරීම සඳහා ය. ශුද්ධ විද්‍යාත්මක සත්‍යයන් තුළ සාධාරණීකරණය කරන ලද සර්ව විශ්වීය විශ්වාස පද්ධතියක් පවත්නේ යැයි පිළිගනු ලැබේ (Rescher and Lucas 2003). එසේ ද වුවත්, භෞතික සත්‍යයන්ට සාපේක්ෂ වශයෙන් පුද්ගල පැවැත්ම කෙරෙහි, සමාජගත මූලධර්මයන් ද විශේෂයෙන් බලපෑම් කරනු ලබයි. හුදෙක් භෞතික මූලධර්මයන් පමණක් නොව, සමාජ සම්මත සංස්කෘතික වින්‍යාසයන් ද පුද්ගලයා කෙරෙහි සුවිශේෂී බලපෑමක් ඇති කරනු ලබන බැවින්, සමාජ සංස්කෘතිය සම්බන්ධයෙන් කිසියම් අවබෝධයක් ලබා ගැනීම ද විශේෂ වේ.

සමාජය පිළිබඳව පුද්ගලයා විසින් ප්‍රත්‍යක්ෂ කරගනු ලබන ඥානය මහජන ඥානය වශයෙන් හැඳින් වේ. එය විද්‍යාඥයෙකු විසින් ග්‍රහණය කරගනු ලබන ඥානයට වඩා වෙනස් ය. සමාන්‍ය සමාජ ක්‍රමයක් තුළ ස්වකීය පැවැත්ම ස්ථාවර කර ගැනීම සඳහා කිසියම් දැනුමක් පුද්ගලයා සතු විය යුතු ය. එකී ඥානය මානව සමාජය තුළ ම අන්තර්ගත වී ඇත. සමාජය නෛසර්ගික වශයෙන් ම ගතික ස්වභාවයක් ගනු ලබන බැවින්, පැරණි සංස්කෘතික පද්ධතීන් බොහෝ දුරට කලානුරූපව වෙනස් විය හැකි

ය. එසේ ද වුවත්, තමා ජීවත් වන සමාජය සම්බන්ධයෙන් කිසියම් අවබෝධයක් ලබා ගැනීමේ හැකියාවක් පුද්ගලයා සතු වෙයි. මේ අනුව යමින් බොහෝ සමාජීය විද්‍යාවන් මගින් සිදු කරනු ලබන්නේ පුද්ගලයා සමාජ ක්‍රමයක් තුළ ස්වකීය පැවැත්ම ස්ථාවර කර ගැනීම සඳහා උත්සාහ කරනු ලබන ආකාරය අධ්‍යයනය කිරීම ය. දේශපාලන විද්‍යාව මගින් පුද්ගලයාගේ දේශපාලනික ක්‍රියාකාරීත්වය කෙරෙහි අවධානය යොමු කරනු ලබන අතර, ආර්ථික විද්‍යාව පුද්ගලයා හා සම්බන්ධ වන නිෂ්පාදන ක්‍රමයන් කෙරෙහි අවධානය යොමු කරයි. එසේ ද වුවත් මානව විද්‍යාව යනු හුදෙක් පුද්ගල පැවැත්ම සම්බන්ධ ද්වීතීක වින්‍යාසයන් කෙරෙහි අවධානය යොමු කරනු ලබන විනය ක්‍රමයක් නොවන අතර, එ මගින් සමාජගත පැවැත්ම සඳහා පුද්ගලයා විසින් ඥාන ග්‍රහණය කරනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳ සුවිශේෂී විග්‍රහයක නියුක්ත වෙයි (Ember and Ember 2015).

පුද්ගල ක්‍රියාකාරීත්වය අවශ්‍යයෙන් ම ස්වකීය පැවැත්ම ස්ථාවර කිරීමේ පරමාර්ථය වෙත දිශාගත වී තිබේ. නො එසේනම් පුද්ගලයා අක්‍රිය ස්වභාවයක් ගනු ඇත. බොහෝ දුරට මානව විද්‍යාව විසින් උත්සාහ කරනු ලබන්නේ කිසියම් සමාජ ක්‍රමයක් තුළ පුද්ගලයන් විසින් ස්වකීය පැවැත්ම තහවුරු කිරීම සඳහා ගනු ලබන උත්සාහයේ ස්වභාවය පිළිබඳ විද්‍යාත්මක ගවේෂණයක නියුක්ත වීම ය. ඒ සඳහා මානවවංශ විද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කිරීම විශේෂයෙන් වැදගත් වෙයි (Bryman 2008; Bryant 2007; Dillon 2014). මානව විද්‍යාවේ විශේෂත්වය ආරක්ෂා වී තිබෙන්නේ අන් කවර සාධකයකටත් වඩා එහි ක්‍රමවේදයට හිමි වන සුවිශේෂීත්වය නිසා ය (Davey and Zhao 2018; Ember and Ember 2015). මානව විද්‍යාව විසින් මානව චර්යාව සම්බන්ධ මූලික නියතීන් අනාවරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන බැවින්, ඒ සඳහා වඩාත් යෝග්‍යතම ක්‍රමවේදය වන්නේ මානව වංශවිද්‍යාත්මක ක්‍රමවේදය යි. එ මගින් සත්‍ය පුද්ගල චර්යාවෙහි ස්වභාවය කුමක් ද යන්න තේරුම් ගැනීමට උත්සාහ කරයි.

මානව විද්‍යාව සහ සමාජ විද්‍යාව අතර යම් සම්බන්ධතාවක් පැවතියත්, දාර්ශනික වශයෙන් එහි පරමාර්ථ සහ ක්‍රමවේදීය පරිකල්පනයන් අතර පැහැදිලි වෙනසක් තිබේ. මානව විද්‍යාඥයා කිසියම් සමාජ සංසිද්ධියක් පැහැදිලි කිරීමට උත්සුක නොවන අතර, එකී සංසිද්ධියෙහි පවතින බහුවිධ යථාර්ථයන් සහ රටාවන් සංස්ලේෂිත වශයෙන් අවබෝධ කර ගැනීමට උත්සාහ කරයි (Dillon 2014; Moran 2000). විශ්ලේෂණය යනු කිසියම් සංසිද්ධියක් කොටස් වශයෙන් හෝ වියුක්ත

වශයෙන් විග්‍රහ කිරීමේ ක්‍රමයකි. ඒ තුළ පරිපූර්ණ සංසිද්ධිය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගත නො හැකි ය. ඇතැම් අවස්ථාවන්හි දී සමස්ත සංසිද්ධිය ම වියුක්ත වශයෙන් විග්‍රහ කළ ද ඒ පිළිබඳ පරිපූර්ණ චිත්‍රයක් ලබා ගත නො හැකි ය. මෙය මානව පැවැත්ම හෝ සංස්කෘතියක් සහිත සමාජ ක්‍රමයක් තුළ පුද්ගල පැවැත්ම පිළිබඳ අර්ධ විග්‍රහයකි. එ බැවින් මානව විද්‍යාඥයා උත්සාහ කරන්නේ වියුක්ත විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට නොවේ, හෙතෙම සමාජ සංසිද්ධීන් පිළිබඳ සංයුක්ත හෝ පරිපූර්ණ විග්‍රහයක් ඉදිරිපත් කරයි. මෙය කෙටි කාලයකින් හෝ බාහිර නිරීක්ෂකයෙකු වශයෙන් සිටීමෙන් හෝ කළ හැකි දෙයක් නොවේ. එ බැවින් මානව විද්‍යාඥයා දීර්ඝ කාලයක් අදාළ සමාජය තුළ එකී සමාජයෙහි ම සමාජිකයෙකු වශයෙන් ජීවත් වෙමින් මානව පැවැත්ම පිළිබඳ යථාර්ථයන් ග්‍රහණය කිරීමට උත්සුක වේ. මේ නිසා මානව විද්‍යාවේ අවසාන පරමාර්ථය වන්නේ මානවයා සහ චර්යාව පිළිබඳ, පුද්ගලයා විසින් දෙනු ලබන අර්ථකථනය අනුව ගොඩ නගන ලද සත්‍ය විග්‍රහයක් ඉදිරිපත් කිරීම ය.

මානව විද්‍යාවේ ආරම්භය යටත්විජිතකරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් විග්‍රහ කරනු ලැබුව ද (Ember and Ember 2015), මුල් කාලීනව ප්‍රාථමික සමාජගත මානවයන්ගේ ස්වභාවය අවබෝධ කර ගැනීම සඳහා මානව විද්‍යාඥයන් විසින් සිදු කරන ලද කාර්ය භාරය, යටත් විජිත පරිපාලන අපේක්ෂාවන් ඉටු කිරීමෙන් ඔබ්බට ගමන් කොට තිබිණ. විශේෂයෙන් ම ටයිලර්, මැලිනොව්ස්කි, බ්‍රවුන් වැනි මුල් කාලීන බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයන් විසින් යුරෝපානු නොවන සමාජයන්හි මානව චර්යාව විග්‍රහ කිරීම් වශයෙන් මානව විද්‍යාව ආරම්භ වෙයි. එහි ප්‍රධාන පරමාර්ථය වූයේ පුද්ගල පැවැත්ම කෙරෙහි මූලික වන මූලධර්මයන් මොනවාද යන්න සොයා බැලීම ය. පැවැත්ම කෙරෙහි හේතු වන මූලධර්මයන් බොහෝ දුරට බහුවිධ ස්වභාවයක් ගත හැකි වුවත් ඒවායෙහි ප්‍රථමික ස්වරූපයන් වෙනස් නොවේ. මේ සම්බන්ධ සමාජ විද්‍යාත්මක වශයෙන් ප්‍රශස්ත විග්‍රහයක් ඉදිරිපත් කරන ලද්දේ ඩුර්කයිම් විසින් ය (Durkheim 1964).

ඩුර්කයිම් තර්ක කරන්නේ, සංකීර්ණ මෙන් ම ප්‍රාථමික යැයි පිළිගනු ලබන සමාජයන්හි ද පුද්ගලයන්ගේ ආගමික චර්යාව ඒකීය මූලධර්ම පද්ධතියක් මගින් මෙහෙයවනු ලබන බව ය. ආගම, සංකීර්ණ සමාජ සංස්ථාවක් වුවත් ඒ සමග පුද්ගලයන් සම්බන්ධ වන්නේ අගම්‍ය මූලධර්ම කිහිපයක් පාදක කොට ගෙන ය. මෙම තත්ත්වය ඩුර්කයම් විසින් පෙන්වා දී තිබේ. මෙය ප්‍රත්‍යක්ෂමූලවාදී සම්ප්‍රදායක්

අනුගමනය කරමින් සිදු කරන ලද විග්‍රහයක් බැවින් ආගමික සම්ප්‍රදායක් පුද්ගලයා වෙත සිදු කරනු ලබන බලපෑම සහ විඥානික ක්‍රියාවලිය මගින් පුද්ගලයාගේ චර්යාවට සිදු කරනු ලබන බලපෑම ඔහු ක්‍රමානුකූලව සංස්ලේෂණය කිරීමට සමත් වී නැත. එසේ ද වුවත් පුද්ගලයාගේ ආගමික චර්යාව සම්බන්ධයෙන් පසු කාලීනව එවන්ස් ප්‍රිඩාඩ්, ගණනාථ ඔබේසේකර වැනි මානව විද්‍යාඥයන් වඩාත් තර්කානුකූල සහ පුද්ගල සමීප අර්ථ විග්‍රහයන් ඉදිරිපත් කොට තිබේ (Fortes and Pritchard 1940).

ආරම්භක අවදියෙහි දී ම මානව විද්‍යාව පුද්ගල චර්යාව හා සම්බන්ධ බහුවිධ ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරනු ලැබිණ. සංස්කෘතිය නමැති පුළුල් ක්ෂේත්‍රයට ඇතුළත් වන බොහෝ තථ්‍යයන් මානව විද්‍යාව මගින් අධ්‍යයනය කරන ලදි. සංස්කෘතික මානව විද්‍යාව යනුවෙන් වඩා පුළුල් විෂයක් බිහි වුවත්, එයට සමගාමී වශයෙන් ආගමික මානව විද්‍යව, දේශපාලන මානව විද්‍යාව, වෛද්‍ය මානව විද්‍යාව, මහජන මානව විද්‍යාව යනුවෙන් බහුවිධ විෂයක්ෂේත්‍ර ගණනාවක් බිහි වූයේ පුද්ගල චර්යාවෙහි පවතින සංකීර්ණතාව හේතුවෙන් ය. මේ අනුව, වෛද්‍ය මානව විද්‍යාව මගින් මානවයාගේ සෞඛ්‍ය චර්යාව සම්බන්ධ බහුවිධ සත්‍යතාවන් ගවේෂණය කළ අතර, දේශපාලන මානව විද්‍යාව මගින් පුද්ගලයාගේ දේශපාලනික ක්‍රියාවලයෙහි ස්වභාවය අධ්‍යයනය කරන ලදි. මෙම විනය ක්‍රමයන්, අනෙක් ආර්ථික හෝ දේශපාලන විද්‍යාවන්ගෙන් පුළුල් වශයෙන් වෙනස් වන බව සැලකිය යුතු ය.

මානව විද්‍යාව පුද්ගල චර්යාව හා සම්බන්ධ බහුවිධ ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරනු ලබන බැවින්, එහි වලංගුතාව සර්වකාලීන ය. විශේෂයෙන් ම ප්‍රත්‍යක්ෂමූලවාදී අධ්‍යයන ප්‍රවේශයන්ගේ නිෂ්පත්තිය හේතුවෙන් මානව විද්‍යා සම්ප්‍රදායන්හි වලංගුතාව පිළිබඳ ප්‍රබල වික්ෂේපයන් වර්ධනය වුවත්, සත්‍ය පුද්ගල සමාජ චර්යාව අවබෝධ කර ගැනීම සම්බන්ධයෙන් මානව විද්‍යාවෙහි අදාළතාව වර්තමානයෙහි වුව ද පිළිගනු ලැබේ. සමාජ විද්‍යාව වුවත්, ඇතැම් අවස්ථාවන්හි දී මානව විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිත කරන ආකාරයක් දැකිය හැකි ය. මේ නිසා නවීන සමාජයන් සම්බන්ධයන් අවබෝධයක් ලබා ගැනීමට ද මානව විද්‍යාවෙහි යෝග්‍යතාව ඉතා ඉහළ මට්ටමක පවතින බව සැලකිය යුතු ය.

මානව විද්‍යාව ආරම්භ වන්නේ නොදියුණු හෝ ප්‍රාථමික සමාජ අධ්‍යයනය කිරීම සඳහා ය. ඒ තුළ කිසියම් අගතිගාමී දෘෂ්ටියක් පැවතිණ. යුරෝපීය විද්වතුන් විසින් යුරෝපානු නො වන සමාජයන් ම්ලේච්ඡ හෝ අඩු දියුණු යැයි විශ්වාස කළ බැවින්,

එකී සමාජවල ස්වභාවය අධ්‍යයනය කිරීම සඳහා මානව විද්‍යාව භාවිත කිරීමට නිර්දේශ කළත්, පසු කාලීනව එකී දෘෂ්ටියෙහි පැවති අගතිගාමීත්වය ක්‍රමයෙන් ඉවත්ව ගිය බවක් පෙනේ. විශේෂයෙන් ම සංස්කෘතීන්හි පවතින සාපේක්ෂතාව හේතුවෙන් සමාජයන් භෞතික වශයෙන් හෝ මතවාදීමය වශයෙන් විඛණ්ඩනය කිරීම අයෝග්‍ය බව මානව විද්‍යාඥයන් විසින් පෙන්වා දෙනු ලැබිණ. කෙසේ වෙතත් මානව විද්‍යාත්මක අධ්‍යයන බොහෝමයක් සිදු කොට තිබෙන්නේ යටත්විජිත රටවල හෝ ප්‍රාථමික සරල සමාජයන්හි ය. එනමුත්, සංකීර්ණ සමාජයන් අධ්‍යයනය සම්බන්ධයෙන් ද මානව විද්‍යාව වැදගත් වන බව පසු කාලීන මානවවංශ විද්‍යාත්මක පර්යේෂණයන්ගෙන් පෙනී ගියේ ය (Lewis 1975). මේ නිසා, වර්තමාන සමාජ ක්‍රමයන් අධ්‍යයනය සම්බන්ධයෙන් මානව විද්‍යාවෙහි පවතින වලංගුතාව පරීක්ෂා කළ යුතු ය.

**මානව විද්‍යාවෙහි අද්‍යතනතාව**

එරික් වුල්ෆ් තර්ක කරන ආකාරයට සමාජීය විද්‍යාවන්හි වඩා මානවවාදී විෂයක් වන්නේ මානව විද්‍යාව ය (Wolf 1966). එ මෙන් ම මානව ශාස්ත්‍රයන් අතර වඩාත් විද්‍යාත්මක ස්වභාවයක් ගන්නේ ද මානව විද්‍යාව යැයි එරික් වුල්ෆ් තර්ක කරන්නේ, මානව විද්‍යාව තුළ තිබෙන මිනිස් ස්වභාවය යථා ස්වභාවයෙන් ම ග්‍රහණය කිරීමේ ශක්‍යතාව මූලික කර ගෙන ය. මූලික වශයෙන් මානව විද්‍යාව ආරම්භ වන්නේ, කේන්ද්‍රයෙන් බැහැර පර්යන්ත සමාජයන්හි ස්වභාවය අධ්‍යයනය කිරීමට වුවත්, මෑත කාලීනව සංකීර්ණ කේන්ද්‍රීය සමාජයන් අධ්‍යයනය සම්බන්ධයෙන් ද මානව විද්‍යාව වැදගත් වන ආකාරය සමාජ විද්‍යාඥයන් විසින් ද පෙන්වා දී තිබේ (Bourdieu 1977). විසි එක් වැනි සියවසෙහි ආරම්භයත් සමග ම මෙතෙක් ලෝක සමාජයන් අත් නොදුටු සමාජ ආස්ථානයන් බොහෝමයක් උද්ගත විය. එහි ව්‍යුත්පන්න ප්‍රතිඵලය වූයේ මානව චර්යාව ද සැළකිය යුතු මට්ටමකින් වෙනස් වීම ය (Bauman 2000). මානව චර්යාවේ වෙනස්වීම්, පුද්ගලයන්ගේ සංතෘප්තිය හෝ ජීවන යහ පැවැත්ම සම්බන්ධයෙන් ද ඍජු බලපෑමක් ඇති කරයි. සමාජ ජීවිතය හෝ පැවැත්ම සඳහා පුද්ගලයාගේ අනවරත උත්සාහය තෘප්ත වන්නේ, ජීවන යහ පැවැත්මේ තෘප්තිය හේතුවෙන් ය. එ බැවින්, වෙනස් වන මානව චර්යාවන්ගේ යථා ස්වභාවය සහ ඒ පිළිබඳ හේතුකරණය වඩා විද්‍යාත්මකව ගවේෂණය කළ හැකි වන්නේ මානව

විද්‍යාව මගින් ය. මානව චර්යාවන් අධ්‍යයනය සම්බන්ධයෙන් සමාජ විද්‍යාඥයා විසින් සිදු කරන ලද සම්මාදම ප්‍රත්‍යක්ෂමූලවාදය මත පදනම්ව ගොඩ නැගී ඇති බවක් පෙනේ. එසේ ද වුවත් මානව විද්‍යාව උත්සාහ කරන්නේ, සමාජ වෙනස සත්‍ය වශයෙන් ම පුද්ගලයා විසින් පරිග්‍රහණය කරනු ලබන ආකාරය ගවේෂණය කිරීමට ය. මෙය අතිශය අපහසු කාර්යයකි.

සංස්කෘතික සාපේක්ෂතාව පිළිබඳ සවිඥානික වීම හේතුවෙන්, නාගරික සහ ග්‍රාමීය සමාජ මෙන් ම දියුණු හෝ නොදියුණු වශයෙන් සමාජයන් වර්ග කිරීමෙහි මූලික පරමාර්ථයන් මානව විද්‍යාව විසින් විද්‍යානුකූල පදනමක් සහිත ව පැහැදිලි කරයි. විශේෂයෙන් ම නවීකරණයෙහි ව්‍යාප්තියත් සමග නාගරික සමාජයන්ගේ ව්‍යාප්තිය ද පුළුල් විය. නාගරික සමාජයන්ගේ බිහි වීම හුදෙක් භෞතික කරුණක් පමණක් නොවන අතර ඒ තුළ පුද්ගල චර්යා ප්‍රකාරයන්හි වෙනස් වීමක් ද නිරූපණය කරයි. සාම්ප්‍රදායික ජන ජීවිතයකට හුරු ව සිටි පුද්ගලයන්, සංකීර්ණ සහ පුද්ගලත්වවාදී ජීවන ක්‍රමයකට හුරු වීම නාගරීකරණයෙහි ප්‍රධාන මූලධර්මයකි. මේ නිසා, නාගරික සමාජ ජීවිතය සම්බන්ධයෙන් ද මානව විද්‍යව විසින් අවධානය යොමු කරයි. මෑත කාලීනව දියුණු සමාජයන්හි නාගරික ජන ජීවිතය පිළිබඳ අධ්‍යයනයන් සඳහා බොහෝ විට මානව විද්‍යාත්මක මූලධර්මයන් භාවිත කළ බවක් පෙනේ (Ritzer 2010). කිසියම් සමාජයක ස්වභාවය සහ මානව චර්යාව අතර පවතින සම්බන්ධතාව අගතියකින් තොරව අවබෝධ කර ගැනීම සඳහා සංස්කෘතික සාපේක්ෂතාව කෙරෙහි විශේෂයෙන් සවිඥානික විය යුතු ය (Tylor 1958). පුද්ගල චර්යාව කෙරෙහි බලපෑම් කරනු ලබන අභ්‍යන්තර සහ සමාජගත හේතු සන්තතීන් බොහෝ දුරට සංස්කෘතිකමය සුවිශේෂීතාවන් මගින් හැඩ ගස්වනු ලැබ ඇත. මේ නිසා මානව විද්‍යාත්මක පර්යවලෝකයක් ආශ්‍රයෙන් අදාළ තත්‍ථ්‍යයන් අවබෝධ කර ගැනීමට උත්සාහ කිරීම විශේෂයෙන් වැදගත් වෙයි.

මානව විද්‍යාව ''අවබෝධනය'' කේන්ද්‍ර කරගත් අධ්‍යයන සම්ප්‍රදායකි. සමාජීය විද්‍යාවන්හි දී අවබෝධනය සහ පැහැදිලි කිරීම නමැති සම්ප්‍රදායන් දෙකක් දක්නට ලැබේ. පැහැදිලි කිරීම හුදෙක් ප්‍රත්‍යක්ෂ මූලවාදය පදනම් කර ගත්තකි. මුල් කාලීන සමාජ විද්‍යා න්‍යාය සම්ප්‍රදායන් බොහෝ දුරට වර්ධනය වූයේ ප්‍රත්‍යක්ෂමූලවාදී සම්ප්‍රදායක් කේන්ද්‍ර කර ගනිමින් ය. එහි මූලික තර්කය වන්නේ, කිසියම් සමාජ සංසිද්ධියක් පුද්ගලයා විසින් දෙනු ලබන අර්ථයන්ට සාපේක්ෂව අධ්‍යයනය කිරීමට වඩා ඉන්ද්‍රියන්ට ප්‍රත්‍යක්ෂ වන ආකාරයෙන් යථානුභවිකව ග්‍රහණය කළ යුතු බව ය.

එසේ ද වුවත්, කිසියම් සංසිද්ධියක බාහිර ස්වභාවයට වඩා පුද්ගලයා විසින් ග්‍රහණය කරනු ලබන ආකාරය විශේෂයෙන් වැදගත් වන්නේ, එය පුද්ගලයාගේ චර්යාව කෙරෙහි ඍජු බලපෑමක් ඇති කළ හැකි බැවින් යැයි මානව විද්‍යාඥයන් පිළිගනියි (Malinowski 1912).

මානව විද්‍යාව අද්‍යතන සමාජ ක්‍රමයන්ගේ ස්වභාවය අවබෝධ කර ගැනීම සම්බන්ධයෙන් විශේෂවීම කෙරෙහි එහි ක්‍රමවේදයෙහි සුවිශේෂත්වය ද බලපෑම් කරයි. මානව වංශවිද්‍යාත්මක ක්‍රමවේදය අතිශය මානවවාදී සහ සත්‍ය මානව චර්යාව පිළිබඳ ගවේෂණයක යෙදෙන ක්‍රමවේදයක් යැයි හඳුනා ගනු ලැබේ (Reeves, Kuper, and Hodges 2008). සමාජ ක්‍රමයක පැවැත්ම සම්බන්ධයෙන් පුද්ගල චින්තනය සහ ආචාර ධර්ම පද්ධතිය විශේෂයන් බලපෑම් කරයි. නූතන සමාජයන්හි වුවත් ජීවන පැවැත්ම සම්බන්ධ පුද්ගල දර්ශනය අන්‍යෝන්‍ය සම්බන්ධතා වර්ධනය වීමෙහි දී වැදගත් වෙයි. නාගරික හෝ ග්‍රාමීය හෝ කිසියම් සමාජ ක්‍රමයක් තුළ තිරසර ජීවන පැවැත්මක් සඳහා පුද්ගලයන්ගේ ආභ්‍යන්තරික චින්තනය සහ සදාචාර පද්ධතිය මූලික වෙයි. මේ සම්බන්ධයෙන් මෑතකදී සිදු කරන ලද බොහෝ පර්යේෂණ සඳහා මානව විද්‍යාත්මක එළඹුම් භාවිත කරන ලද බවක් පෙනේ (Davis, Hennes, and Raymond 2018). එ මෙන් ම, මානසික රෝග ව්‍යාප්තිය නූතන නාගරික සමාජ ක්‍රමයන් තුළ විශේෂයෙන් දක්නට ලැබේ. එ වැනි තත්ත්වයන් ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන හේතු සහ රෝගය හේතුවෙන් පුද්ගල චර්යාවට කරනු ලබන බලපෑම අවබෝධ කර ගැනීම මානව යහ පැවැත්ම සම්බන්ධයෙන් විශේෂයෙන් වැදගත් වේ. මේ සම්බන්ධයෙන් මෑතකදී සිදු කරන ලද බොහෝමයක් පර්යේෂණ සඳහා මනෝ විද්‍යාව සහ මනෝ රෝග පිළිබඳ වෛද්‍ය විද්‍යාව මූලික වුවත්, වෛද්‍ය විද්‍යාඥයන් වුවත් මානවවංශවිද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කරමින් මනෝ රෝග පිළිබඳ අධ්‍යයනය කළ බව පෙනේ (Thomas et al. 2018).

ගෝලීයකරණය හේතුවෙන් වෙනස් වන සමාජ ව්‍යුහය, සමාජ සංවිධානයෙහි සැකැස්ම කෙරෙහි ද බලපෑම් කරයි (Castells 2000). එහි දී සමාජ ජීවිතයෙහි ස්ථාවරත්වය වෙනුවට අස්ථාවරත්වය අනුයුක්ත වෙයි. මේ නිසා වර්තමාන මිනිසා නිරන්තරයෙන් ම අස්ථවරත්ව මානසිකත්වයකින් පසු වන්නේ යැයි ඇතැමෙක් තර්ක කරත් (Beck 1992). අනවරත අවධානම් සහගත තත්ත්වයකට මැදිහත් වන පුද්ගලයාගේ මානසික මට්ටම අස්ථාවර වෙයි. මෙ වැනි අවස්ථාවක පුද්ගල චර්යාව

ද විපර්යස්ථ වෙයි (Bauman 2000). අස්ථාවරත්වය මුල් බැස ගැනීමත්, පුද්ගල චර්යාව නිරන්තරයෙන් ම අවධානම සඳහා සූදානම් වීමත් හේතුවෙන් අසහනකාරී හෝ පීඩාකාරී තත්ත්වයක් සමාජයක් තුළ ව්‍යාප්ත විය හැකි ය. මෙහි දී පුද්ගලයා නෛසර්ගික වශයෙන් ම ආගමික ක්‍රියාකාරකම්වලට යොමු වන අතර, නවීනත්වය හේතුවෙන් අනාගමිකත්වය වැළඳගනු ලබන පුද්ගලයන් වුවත් විවිධ මිථ්‍යා විශ්වාසයන්ට යොමු වෙමින් ස්වකීය මානසික පීඩනය අවම කර ගැනීමට උත්සාහ කරන ආකාරය වර්තමාන මානව විද්‍යාඥයන් විසින් පෙන්වා දී ඇත (Hogg, Adelman, and Blagg 2010). මේ හේතුවෙන්, වර්තමාන සංකීර්ණ සමාජයන්හි වුවත් සංකීර්ණ පුද්ගල චර්යාවනහි යථා ස්වභාවය ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කර ගැනීම සඳහා මානව විද්‍යාව විශේෂයෙන් වැදගත් වන බව පැහැදිලි ය.

මානව විද්‍යාවෙහි වලංගුභාවය හෝ විද්‍යාත්මක භාවය විවේචනය කරනු ලබන ඇතැම් ප්‍රත්‍යක්ෂමූලවාදී සමාජීය විද්‍යාඥයන්ගේ ප්‍රධාන තර්කයක් බවට පත් වන්නේ සංඛ්‍යානමය වශයෙන් මිණුම් කිරීමේ නො හැකියාව හෝ දීර්ඝ ආඛ්‍යාන සහිත විග්‍රහයන් ඉදිරිපත් කිරීම මානව විද්‍යාවේ දුර්වලතාවක් බව ය (Kasmir and Carbonella 2008). ඇතැම් භෞතික හෝ ජීවවිද්‍යාඥයන් විසින් ද සංස්කෘතික මානව විද්‍යාවෙහි වලංගුභාවය පිළිබඳ තීව්‍ර විවේචනයන් ඉදිරිපත් කොට තිබේ. ඔවුන් තර්ක කරනු ලබන්නේ ජීව විද්‍යාත්මක හෝ භෞතික විද්‍යාත්මක මූලධර්මයන් සංස්කෘතික මූලධර්මයන්ට වඩා පුද්ගල පැවැත්ම කෙරෙහි සුවිශේෂී බලපෑමක් ඇති කරන බව ය (Dawkins 2005, 2006). එසේ ද වුවත්, සංස්කෘතික මානව විද්‍යාඥයා වඩාත් සවිඥානික වන්නේ ජීව විද්‍යාත්මක හෝ භෞතික විද්‍යාත්මක සත්‍යතාවන් කෙරෙහි නොවේ, ''සත්‍ය'' යැයි පුද්ගලයා විසින් පිළිගනු ලබන හෝ සවිඥානික වන තත්ත්වයන් කෙරෙහි ය. ඇතැම් විට පුද්ගලයා විසින් සත්‍ය යැයි පිළිගනු ලබන යථාර්ථයන් භෞතික විග්‍රහයක දී අසත්‍ය වීමට ද ඉඩ තිබේ. එසේ ද වුවත්, සමාජ ක්‍රමයක් තුළ පුද්ගලයාගේ චර්යාව කෙරෙහි පුද්ගලයා විසින් සත්‍ය යැයි සවිඥානික වන තථ්‍යය විශේෂයෙන් වැදගත් වෙයි. වර්තමාන නාගරික සමාජයන්හි අතිශය විද්‍යාත්මක සහ තර්කානුකූල ජීවන පැවැත්මක් දක්නට ලැබුණ ද අවසාන විග්‍රහයෙහි දී මිථ්‍යා විශ්වාසයන් පිළිගැනීම වැනි අතාර්කික තත්ත්වයන් ද දක්නට ලැබේ (Tlusty 2015). මානව පැවැත්ම සම්බන්ධ තාර්කිකත්වයක් හෝ අතාර්කිකත්වයක් පිළිගත නො හැකි වන අතර, එය පුද්ගලයා විසින් අවස්ථානුකූලව ග්‍රහණය කරනු ලබන්නකි. මේ නිසා එක් අවස්ථාවක දී තාර්කික වන යථාර්ථයක් තවත් අවස්ථාවක

දී අතාර්කික යැයි පිළිගත හැකි ය. මෙ වැනි සුවිශේෂී තත්ත්වයන් මානව විද්‍යාව විසින් ග්‍රහණය කරනු ලබයි. එහි දී ද වඩාත් වැදගත් වන්නේ සංස්කෘතික මානව විද්‍යාව ය.

**සාරාංශය**

සමාජීය විද්‍යාවන් අතර වඩාත් මානවවාදී විද්‍යාත්මක විනය ක්‍රමයක් වශයෙන් මානව විද්‍යාව හඳුනාගනු ලබන අතර, පුද්ගල චර්යාවන්හි සුවිශේෂීතාවන් විෂද කිරීමෙහි ශක්‍යතාවක් ඒ තුළ පවතියි. මුල් කාලීනව ප්‍රාථමික හෝ සරල යැයි සලකන දල සමාජයන් අධ්‍යයනය කිරීම සඳහා ආරම්භ වූ මානව විද්‍යාව පසු කාලීනව විවිධ ක්ෂේත්‍රයන් ඒකාබද්ධ කරමින් වඩාත් පුළුල් වූ බවක් පෙනේ. එහි දී සංස්කෘතික මානව විද්‍යාව මගින් සංස්කෘතික පුද්ගලයාගේ සමාජ චර්යාවෙහි සංකීර්ණතාවන් සහ බහුවිධතාවන් අධ්‍යයනය කරමින් ඔවුන්ගේ යහපැවැත්ම සඳහා කිසියම් මග පෙන්වීමක් සිදු කරන ලදි. සමාජය ක්‍රමයෙන් නවීකරණය වීමත් සමග මානව විද්‍යාවෙහි වලංගු භාවය අවම වන්නේ යැයි අයෙක් තර්ක කළත්, එහි වැදගත්කම තව දුරටත් පවතින ආකාරය ඉහත පෙන්වා දෙන ලදි. සමාජ ක්‍රමයක් නවීකරණය වීමත් සමග පුද්ගලයන්ගේ පැවැත්ම පිළිබඳ චර්යාව ද සංකීර්ණත්වයට පත් වන බැවින් එකී තත්ත්වයන් පැහැදිලි ව ප්‍රත්‍යක්ෂ කර ගැනීම සඳහා සංස්කෘතික මානව විද්‍යාවෙහි දායකත්වය අතිශය වැදගත් වනු ඇත.

ආශ්‍රය ග්‍රන්ථ නාමාවලිය

Bauman, Zigmant. 2000. *Liquid Modernity*. Cambridge: Polity Press.

Beck, Ulrick. 1992. *Risk Society: Towards a New Modernity*. London: Sage.

Bourdieu, Pierre. 1977. *Outline of a Theory of Practice*. Cambridge: University Press.

Bryant, Antony. 2007. “The SAGE Handbook of Grounded Theory.”

London: SAGE.

Bryman, A. 2008. *Social Research Methods*. Oxford: Oxford University Press.

Castells, Manuel. 2000. *The Rise of Network Society, The Information Age: Economy, Society and Culture*. Cambridge (MA): Blackwell.

Davey, Gareth, and Xiang Zhao. 2018. "Lay Understandings of Health among Dai Lue in Xishuangbanna, China." *The Asia Pacific Journal of Anthropology* 19 (2): 154–69. https://doi.org/10.1080/14442213.2017.1413589.

Davis, Taylor, Erin P. Hennes, and Leigh Raymond. 2018. "Cultural Evolution of Normative Motivations for Sustainable Behaviour." *Nature Sustainability* 1 (5). Nature Publishing Group: 218–24. https://doi.org/10.1038/s41893-018-0061-9.

Dawkins, Richard. 2005. *The Ancestor's Tale: A Pilgrimage to the Dawn of Evolution*. US: Hughfton Mifflin.

———. 2006. *The Selfish Gene*. Oxford: University Press.

Dillon, M. 2014. *Introduction to Social Theory*. UK: Wiley Blackwell.

Durkheim, Emile. 1964. *The Elementary Form of Religious Life*. London: George Allen and Unwin.

Ember, Carol R, and Melvin Ember. 2015. *Cultural Anthropology*. Boston: Pearson.

Fortes, M, and E E E Pritchard. 1940. *African Political Systems*. New York: Oxford University Press.

Hogg, Michael A, Janice R Adelman, and Robert D Blagg. 2010. "Religion

in the Face of Uncertainty: An Uncertainty-Identity Theory Account of Religiousness." *Personality and Social Psychology Review* 14 (1): 72–83. https://doi.org/10.1177/1088868309349692.

Kasmir, Sharryn, and August Carbonella. 2008. "Critique of Anthropology Dispossession and the Anthropology of Labor." https://doi.org/10.1177/0308275X07086555.

Lewis, Oscar. 1975. *Five Families: Mexican Case Study in the Culture of Poverty*. New York: Basic Books.

Malinowski, Bronislow. 1912. *Argonauts Of The Western Pacific*. London: George Routledge. https://archive.org/details/argonautsofthewe032976mbp.

Moran, D. 2000. *Introduction to Phenomenology*. London: Routledge.

Reeves, Scott, Ayelet Kuper, and Brian David Hodges. 2008. "Qualitative Research Methodologies: Ethnography." *BMJ (Clinical Research Ed.)* 337 (August). British Medical Journal Publishing Group: a1020. https://doi.org/10.1136/BMJ.A1020.

Rescher, Nicholas, and George R Lucas. 2003. *Epistemology: An Introduction to Theory of Knowledge*. New York: State University.

Ritzer, George. 2010. *McDonaldization: The Reader - Google Books*. 3rded. Los Angelese: SAGE.

Thomas, Felicity, Lorraine Hansford, Joseph Ford, Katrina Wyatt, Rosemarie McCabe, and Richard Byng. 2018. "Moral Narratives and Mental Health: Rethinking Understandings of Distress and Healthcare Support in Contexts of Austerity and Welfare Reform." *Palgrave Communications* 4 (1). Nature Publishing Group: 39.

https://doi.org/10.1057/s41599-018-0091-y.

Tlusty, B. Ann. 2015. “Invincible Blades and Invulnerable Bodies: Weapons Magic in Early-Modern Germany.” *European Review of History: Revue Européenne D’histoire* 22 (4). Routledge: 658–79. https://doi.org/10.1080/13507486.2015.1028340.

Tylor, Edward B. 1958. *Primitive Culture*. New York: Harper.

Wolf, Eric R. 1966. *Peasants*. New Jersey: Englewood Cliffs.